සැ. යු.- (i) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2017 වර්ෂය සඳහා කෑගල්ල දිස්ත්‍රික් අධිකරණ කලාපයට අයත් ජූරි සභිකයින්ගේ නාමාවලියක් භාෂාත්‍රයෙන් ම පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,006 - 2017 පෙබරවාරි මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2017.02.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 404 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 මාර්තු මස 03 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 පෙබරවාරි මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


403- B 81143 — 5,403 (2017/02)
F 1 -

# තනතුරු - ඇබෑර්තු

## බස්නාහිර පළාතේ, පළාත් සභාවේ, පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා පුරප්පාඩුව පිරවීමට අයදුම්පත් කැඳවීම

2017.02.20 දින සිට පුරප්පාඩු වීමට නියමිත බස්නාහිර පළාතේ, පළාත් සභාවේ, පහත සඳහන් තනතුර සඳහා තනතුරට අදළ සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමට නියමිත තනතුර සඳහා සේවාවන් හා සුදුසුකම්.-*

| *තනතුර* | *තනතුර අයත් සේවය* | *සුදුසුකම්* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|---|
| පළාත් ආයුර්වේද කොමසාරිස් | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ අධි ශ්‍රේණිය | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ අධි ශ්‍රේණියෙහි නිලධාරියෙකු වීම | 01 |

02. *වෙනත් :*

*අයදුම්කරුවන් :*

- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු යි.
- විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු යි.
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා වන සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණකර තිබිය යුතු ය.
- අදළ සේවයේ/පන්තියේ/ශ්‍රේණියේ පත්වීම ස්ථිරකර තිබිය යුතු ය.
- පසුගිය වසර 5 තුළ කිසිදු විනයානුකූල දඬුවමකට යටත් නොවූ අයකු විය යුතු අතර, එම වසර 05 තුළ දී සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු ය.
- තම තනතුරේ සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු යි.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :*

මෙම නිවේදනයේ දක්වා ඇති ඉහත තනතුර සඳහා ඉල්ලුම් කරනු ලබන අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂාව සඳහා බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමා විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයන්හි ඉහළම ලකුණු ලබාගත් අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. ලකුණු ලබාදීමේ පිළිවෙල ඇමුණුම් 01 හි දක්වේ.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා සතු වේ.

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :*

මෙම පත්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභා නව කාර්ය පටිපාටික රීති, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, අදළ සේවා ව්‍යවස්ථා හා අදළ සේවයට පත්කරමින් නිකුත්කරන ලද පත්වීම් ලිපියේ සඳහන් විධිවිධානයන්ට යටත්වන අතර, ගරු ආණ්ඩුකාරතුමා විසින් කලින් කලට නිකුත්කරනු ලබන පළාත් සභා රෙගුලාසි/ප්‍රඥප්ති/මුල්‍ය රීති විධි විධානවලට යටත් විය යුතු වේ.

තෝරාගනු ලබන අයදුම්කරුවන් බස්නාහිර පළාත් සභාවේ වර්ෂ 03ක කාලයක් සේවය කිරීමට එකඟ විය යුතු ය.

05. *අයදුම්පත් ඉදිරිපත්කිරීම :*

සියලුම අයදුම්පත් විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණකර 2017.03.07 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ, තෝරා ගතහොත් නිදහස්කළ හැකි බවට සිය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ද සහිතව ''ආණ්ඩුකාර ලේකම් (බ. ප.) ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, 05 වන මහල, අංක 109, රොටුන්ඩා ගොඩනැගිල්ල, ගාලු පාර, කොළඹ 03.'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ අදළ තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාදවීම හෝ නැතිවීම ගැන කිසිදු පැමිණිල්ලක් මෙම කාර්යාලය භාරගනු නොලැබේ. ඉදිරිපත් කළ යුතු ආදර්ශ අයදුම්පත්‍රයක් ඇමුණුම 02 හි දක්වෙන අතර, එය **www.secgov.wpc.gov.lk** වෙබ් අඩවියෙන් බාගත හැකි ය.

*සටහන*.- සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත්කරන ලද හැඳුනුම්පත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පිළිගනු ලැබේ.

6. *සාවද්‍ය තොරතුරු සැපයීම :*

අයදුම්කරු විසින් අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව තනතුරෙන් පහකිරීමට කටයුතු කරනු ලැබේ.

පී. සෝමසිරි,
ආණ්ඩුකාර ලේකම්,
බස්නාහිර පළාත.

2017 ජනවාරි මස 25 වැනි දින.

*ඇමුණුම 01*

**බස්නාහිර පළාත් සභාවේ, පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ, පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා නිලධාරියකු තෝරා ගැනීමට අදළ ලකුණු ලබාදීමේ පිළිවෙල**

01. *ජ්‍යෙෂ්ඨත්වය :* (උපරිම ලකුණු 35)

1. ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවාවේ අධිශ්‍රේණියට පත් වූ දින සිට එක් වසරකට ලකුණු 07 බැගින්

02. *අධ්‍යාපන සුදුසුකම් :* (උපරිම ලකුණු 15)

1. දර්ශනශූරී (ලකුණු 15)
2. දර්ශනපති (ලකුණු 12)
3. ශාස්ත්‍රපති/විද්‍යාපති/හෝ ඒ සමාන වෙනත් පශ්චාත් උපාධියක් වෙනුවෙන් (ලකුණු 10)
4. අමතර පශ්චාත් උපාධි (ලකුණු 05)
(අධිශ්‍රේණියට පත්කිරීම සඳහා අදළ කර ගන්නා ලද පශ්චාත් උපාධි සුදුසුකම් සඳහා ලකුණු දෙනු නොලැබේ.)

03. *ක්ෂේත්‍රයට අදළ කටයුතු පිළිබඳ පළපුරුද්ද :* (උපරිම ලකුණු 20)

1. රෝහල්/පරිපාලනය පිළිබඳ වසර 3 ක පළපුරුද්ද, වසරකට ලකුණු 04 බැගින් (ලකුණු 12)
2. පරිපාලනයට අදළව ලබාඇති සති 02ට වැඩි පුහුණු පාඨමාලා එකකට ලකුණු 02 බැගින් (ලකුණු 08)

04. *කාර්ය සාධන ඇගයුම* : (පූර්වාසන්න වසර 05 සඳහා) (වසරකට උපරිම ලකුණු 02) (උපරිම ලකුණු 10)

1. විශිෂ්ඨ (ලකුණු 02)
2. සාමාන්‍ය ප්‍රමාණයට ඉහළ (ලකුණු 01)
3. සතුටුදයකයි (ලකුණු 1/2)

05. *අමතර සුදුසුකම් :* (උපරිම ලකුණු 15)

1. ක්ෂේත්‍රයට අදළව පළකර ඇති නිබන්ධන, ලිපි වාර්තා/වැඩ සටහන් (ලකුණු 06)
2. අනෙකුත් රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය (සිංහල/දෙමළ) (ලකුණු 04)
3. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ආයුර්වේද වෛද්‍යවරයෙකු ලෙස වසර 03කට වැඩි සේවය සඳහා එක් වසරකට එක් ලකුණ බැගින් (උපරිම ලකුණු 5 යි.)

06. සම්මුඛ පරීක්ෂණය (උපරිම ලකුණු 05)

**මුළු ලකුණු** **ලකුණු 100**

*ඇමුණුම 02*

**බස්නාහිර පළාතේ පළාත් සභාවේ ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා වූ අයදුම්පත**

1. මුලකුරු සමඟ නම (සිංහලෙන්) :.................................................................................................................මයා/මිය/මෙනවිය

   (ඉංග්‍රීසියෙන්) Mr./Mrs./Miss :.......................................................................................................................

2. මුලකුරුවලින් හැඳින්වෙන නම්/නම (සිංහලෙන්) :...............................................................................................

   (ඉංග්‍රීසියෙන්) :.....................................................................................................................................

3. 3.1 රාජකාරි ලිපිනය :.......................................................................................................................

   3.2 රාජකාරි දුරකථන අංකය :................................................................................................................

   3.3 ස්ථිර ලිපිනය :.............................................................................................................................

   3.4 පෞද්ගලික දුරකථන අංකය : නිවස :........................................................................

   ජංගම :........................................................................

4. 4.1 උපන් දිනය : අවු. :.................... මාසය :.............................. දිනය :...........................

   4.2 වයස (අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට) : අවු. :...................... මාස :........................... දින :.........................

5. ජාතික හැඳුනුම්පත් අංකය :..............................................................................

6. 6.1 ශ්‍රී ලං.ආයු. වෛද්‍ය සේවයට පත් වූ දිනය :..........................................................................................

   6.2 සේවයේ ස්ථිර කළ දිනය :.............................................................................................................

7. 7.1 ශ්‍රී ලං.ආයු. වෛද්‍ය සේ. අධිශ්‍රේණියට උසස් වූ දිනය :.....................................................................

   7.2 එම උසස්වීම් ලිපියේ අංකය හා දිනය :................................................................................................

8. 8.1 දැනට දරන තනතුර හා එම තනතුරට ඔබ පත් කරන ලද ලිපියේ අංකය හා දිනය :.........................................................

9. (i) අධ්‍යාපන සුදුසුකම් (පශ්චාත් උපාධි ඩිප්ලෝමා/පශ්චාත් උපාධිය/දර්ශනපති/දර්ශනශූරි) :

| *අධ්‍යාපන සුදුසුකම්* | *පෙනී සිටි මාධ්‍යය* | *ආයතනය* | *සහතිකය වලංගු වන දිනය* |
|---|---|---|---|
| | | | |

(ii) වෘත්තීය/වෙනත් සුදුසුකම් :

| *වෘත්තීය සුදුසුකම්* | *පෙනී සිටි මාධ්‍යය* | *ආයතනය* | *සහතිකය වලංගු වන දිනය* |
|---|---|---|---|
| | | | |

10. ලබා ඇති පුහුණු (දේශීය/විදේශීය) :

| *පාඨමාලාව* | *පෙනී සිටි මාධ්‍ය* | *ආයතනය* | *සහතිකය වලංගු වන දිනය* |
|---|---|---|---|
| | | | |

11. වෙනත් භාෂාවන් පිළිබඳව ලබා ඇති සුදුසුකම් :..........................................................................................................

ම විසින් ඉහත සඳහන් කළ තොරතුරු නිවැරදි බව ද, පසුගිය අවුරුදු (5) ඇතුලත දී නියමිත වැටුප් වර්ධක ම විසින් උපයාගෙන ඇති බව ද, කිසිදු විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව ද ප්‍රකාශ කරමි.

දිනය :.......................................................... අයදුම්කරුගේ අත්සන :.......................................................................

*ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :*

අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති ඉහත තොරතුරු නිවැරදි බවත්, දැන්වීමෙහි සුදුසුකම් සපුරා ඇති බවත්, දැනට මෙම අයදුම්කරුට විරුද්ධව කිසියම් විනය කටයුත්තක් නොපැවැත්වෙන බවත්, උසාවියකින් දඬුවම් ලබා නොමැති බවත්, මෙයින් සහතික කරමි.

දිනය :.......................................................... ආයතන ප්‍රධානියාගේ අත්සන :........................................................

**අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**

අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බවත්, දැන්වීමෙහි සුදුසුකම් සපුරා ඇති බවත්, දැනට මෙම අයදුම්කරුට විරුද්ධව කිසියම් විනය කටයුත්තක් නොපැවැත්වෙන බවත්, උසාවියකින් දඬුවම් ලබා නොමැති බවත්, මෙයින් සහතික කරමි. මෙම නිලධාරියා/ නිලධාරිනිය ඉල්ලා ඇති තනතුරට තෝරා ගතහොත් අනුප්‍රාප්තිකයෙකු රහිතව/සහිතව නිදහස් කිරීමට එකඟ වෙමි./නොවෙමි.

දිනය :.......................................................... .....................................................................................................

අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

02-455

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.